# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,413 - 2024 නොවැම්බර් මස 29 වැනි සිකුරාදා - 2024.11.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# II කොටස : අධිකරණ

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් … … | |
| පනත් කෙටුම්පත් … … | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් … … | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් … … | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් … … | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් … … | — |
| පිස්කල් විකිණීම … … | 494 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් … … | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් … … | — |
| නොතාරිස් ලැයිස්තුව … … | — |
| විවිධ දැන්වීම් … … | — |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 දෙසැම්බර් 20 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 දෙසැම්බර් මස 06 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

493- B 82631 —563 (2024/11)
C1-

# පිස්කල් විකිණීම්

**කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

සිවිල් නඩු විධාන සංග්‍රහයේ 255 වන වගන්තියට අනුව පිස්කල් විසින් කරනු ලබන පිස්කල් විකිණීම
(සිය සිවිල් අධිකරණ බලය විෂයයෙහි)

සෙලාන් බැන්ක් පීඑල්සී.,
(කලින් සෙලාන් බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින් වූ)
සෙලාන් ටවර්ස්,
අංක 69, ජනාධිපති මාවත,
කොළඹ 01.

................*පැමිණිලිකරු.*

නඩු අංකය : HC (Civil) 594/10
ස්වභාවය : *උකස්*
වටිනාකම : රු. 3,053,425.26
ඇස්කිසි අංකය : 39/2024

*එදිරිව*

01. බෝද්දර ගමගේ ලාල් උදය කුමාර හිනටිගල
02. පහල රාළලාගේ ප්‍රියන්ති කුමාරි සේනානායක

*දෙදෙනාම* : අංක 62/1,
දඹුලුවත්ත, කිනිගම, බුත්පිටිය හි "හිනටිගල ඇපරල්" යන නාමය විලාශය සහ ව්‍යාපාර නාමය යටතේ හවුල් ව්‍යාපාර ගෙන යයි.

03. කුසුමා හිනටිගල
*විවාහයට පෙර* : හවුපෙ ගමගේ කුසුමාවතී
අංක 62/1, දඹුලුවත්ත, කිනිගම.

*විත්තිකරුවන්ගේ නව ලිපිනය :*

අංක 68,
රාමසිංහ පාර, කිරිබත්ගොඩ.

*3 වන විත්තිකාරියගේ නව ලිපිනය :*

අංක 06, හොරණ පාර, පන්නිපිටිය, කොට්ටාව.

.........*විත්තිකරුවන්.*

බස්නාහිර පළාතේ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2014ක් වූ මාර්තු මස 26 වැනි දිනැති නඩු තීන්දුව අනුව පැමිණිල්ලේ ආයාචනයේ අයැද ඇති පරිදි විත්තිකරුවන් විසින් පැමිණිලිකාර බැංකුව වෙත රුපියල් 983,329.38 ක මුදල සහ රුපියල් 735,735.24ක මුදලක් මත වර්ෂ 2007.11.07 දින සිට තීන්දු ප්‍රකාශිත දින දක්වා වර්ෂයකට 32% බැගින් පොළිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොළිය සහ රුපියල් 2,070,095/88ක මුදල් රුපියල් 1,500,000/- ක මුදලක් මත 2007.11.07 වැනි දින සිට තීන්දු ප්‍රකාශ දින තෙක් වර්ෂයකට 32% බැගින් පොළිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නෛතික පොළිය ද තක්සේරු කරනු ලබන නඩු ගාස්තු ද විත්තිකරුවන් විසින් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින්, ඒ අනුව විත්තිකරුවන්ට එරෙහිව ක්‍රියාවේ යෙදවීම සඳහා මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරි පත්‍රයේ බලය පිට, දැනටමත් තහනමට ගෙන ඇති දේපළ,

**වර්ෂ 2024ක් වූ දෙසැම්බර් මස 24 වැනි දින පෙ. ව. 11.30 ට,**

එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සියනෑ කෝරළේ, මැද පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ, කිනිගම සහ පිටුවල්ගොඩ හි පිහිටි දඹුවවත්ත නම් ඉඩමට වරලත් මිනින්දෝරු සී. ද එස්. ගුණතිලක විසින් මැන බෙදා සාදන ලද අංක 276 සහ 1972/04/05 (2003/10/03) දිනැති පිඹුරේ කැබලි අංක 113 දරන, උතුරට : කැබලි අංක 112 ද, නැගෙනහිරට : කැබලි අංක 109 ද, දකුණට : කැබලි අංක R1 ද (පාරක් සඳහා වෙන් කරන ලද) සහ බස්නාහිරට : කැබලි අංක 114 ද, මායිම් වූ රූඩ් එක (රූඩ් 1) ක ප්‍රමාණයෙන් යුතු නිශ්චිත බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි සියල්ල සමග වේ.

ඉහත අංක 276 දරන පිඹුර ප්‍රකාරව ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 813/195 හි ලියාපදිංචි කර ඇත.

*දේපළට ගමන් මග.-* කොළඹ සිට නුවර පාරෙන් මිරිස්වත්ත හංදිය දක්වා පැමිණ එතැන් සිට දකුණට ඇති වතුරගම පාරෙන් කි. මී. 2.3ක් දඹුව වත්ත දක්වා පැමිණ වමට ඇති දඹුව වත්ත පාරෙන් මීටර් 700ක් "Y" හංදිය හමුවන තෙක් පැමිණෙන්න. පසුව දකුණට ඇති අඩි 30ක් පමණ පළල පාරෙන් මීටර් 50ක් ගිය පසු දකුණට වන්නට මෙම විෂයගත දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) සම්පූර්ණ මුදල ගෙවන්නේ නැතිනම් ගැනුම් මිලෙන් 25%
(2) ප්‍රචාරණ වියදම්
(3) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියේ (අ) යටතේ අයකිරීම් ද,

ගැනුම් මිලෙන් 75%ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත බස්නාහිර පළාත් වාණිජ මහාධිකරණයේ ඉහත නඩුවට බැර කළ යුතු ය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාල සීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට පැමිණිලිකරුට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමනාකරු - දේපළ අංශය, සෙලාන් බැන්ක්, අංක 90, ගාලු පාර, කොළඹ 03.

011-2456485, 011-2456479, 011-2456473.

රෙජිස්ට්‍රාර්,
බස්නාහිර පළාතේ මහාධිකරණය.

11-321

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.